# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1687/16 - 2011 ජනවාරි 04 වැනි අඟහරුවාදා - 2011.01.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

එල්.ඩී.බී 69/49

## රජයේ නිවේදන

**(351 වන අධිකාරය වූ) ආගාමික හා විගමික පනත**

3 වන වගන්තිය යටතේ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදය සමග කියවිය යුතු (351 වන අධිකාරය වූ) ආගාමික හා විගමික පනතේ 3 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති, මහින්ද රාජපක්ෂ වන මා විසින්, මෙම උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වරායන්, මෙම පනතේ කාර්ය සඳහා "ඇතුල්වීමේ සහ පිටවීමේ අනුමත වරායන්" විය යුතු බවට මෙම නියමය මගින් ප්‍රකාශයට පත් කරමි.

**උපලේඛනය**

ඇතුල්වීමේ සහ පිටවීමේ අනුමත වරායන්

1. මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය.
2. නොරච්චොලෙයි වරාය.
3. ඔලුවිල් වරාය.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2010 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

01-367